# වේදකාලීන සමාජය පිළිබඳ තොරතුරු ලබාගැනීමේ දී ඍග්වේද මූලාශ්‍රයේ ප්‍රාමාණිකත්වය

කළුවානේ කුමාරකස්සප හිමි

**Abstract**

**The Ṛgveda** originated in the minds of some early free-thinkers who expressed their thoughts in the form of hymns. This Veda is today universally recognized as the earlist extant scripture of mankind. This goes more than 3000 years back to the time period. A vast number of Indian people simply regard this Vada as a sacred book of knowledge and the source of all existing religions.This Veda tells us most about the basic facts that human life and the universe in which ancients' excisted. No one can understand the spiritual life and culture of the ancient Indians without acquiring and insight in to the Vedic literature.

In this research paper, my investigation is to get informations on the ancient society of Vedic era from the Ṛgveda. The question arise that wather the **Ṛgveda** will provide the validity source to acquir knowledge of Vedic society? Or this just only hymns of the seers who chanted for their religious performances.

**Kyewords:-** The Ṛgveda, hymns, God, Veda, Vedic literature, seers

**හැඳින්වීම**

මානව සංහතියේ ඉතිහාසය හා ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ අධ්‍යයනය සඳහා ඇති පැරණිම කෘතිය වන්නේ **ඍග්වේදයයි.** එහි අන්තර්ගත සූක්ත හෙවත් ස්තුති ගීතිකා 1028ක් පමණ අධ්‍යයන

කිරීමේදී එවා නිදහස් චින්තකයන්ගේ මනසිත් ප්‍රකාශවුණු ඔවුන්ගේ සිතුම් පැතුම් බව පැහැදිලිය. ඉන්දියානුවන් ඇතුළු විශාල සංඛ්‍යාවකගේ තවදුරටත් පවතින විශ්වාසය නම් මෙම වේද ග්‍රන්ථ පූජනීය ග්‍රන්ථ මෙන්ම පසුකාලීන ඉන්දියානු ආගම්වලට මූලාධාරය බවයි.

එවන් පෞරාණික ආගමික ග්‍රන්ථයක් තුළින් එකල පැවති සමාජය පිළිබඳ තොරතුරු ලබාගැනීම විවිධ පැතිකඩ ඔස්සේ කළ යුතුය. ඒ සඳහා මෙම සූක්ත සියුම්ව අධ්‍යයනය කිරීම ඉතා වැදගත්ය. එහිදී ලැබෙන තොරතුරුවල වලංගුභාවය මත **ඍග්වේදය** වේදකාලීන සමාජය අධ්‍යයන කිරීම සඳහා ප්‍රාමාණික මූලාශ්‍රයක් ද යන්න තහවුරු කළ හැකිය.

**පර්යේෂණ ගැටලුව**

වේදකාලීන සමාජය පිළිබඳ අධ්‍යයනය කිරීමේදී **ඍග්වේදය** ප්‍රාමාණික මූලාශ්‍රයක් ද?

**පර්යේෂණ අරමුණු**

වේදකාලීන සාමාජීය තොරතුරු ලබාගැනීමේදී **ඍග්වේදය** ලබාදෙන තොරතුරු ප්‍රාමාණිකත්වයෙන් සැලකිය හැකිදැයි සොයා බැලීම.

**පර්යේෂණයේ වැදගත්කම**

ක්‍රි. පූ. 3000 ට වඩා පැරණි මිනිස් සමාජයේ තොරතුරු ලබාගැනීම, ඔවුන්ගේ සිතුම්-පැතුම්, අදහස් උදහස් සමාජයීය තොරතුරු ලබාගැනීම සඳහා වෙනත් ග්‍රන්ථයක් දක්නට නොමැත. පුරාවිද්‍යාත්මකව සොයාගත් යම් යම් සාධක සාක්ෂ්‍යවලින් සනාථ කරගන්නා ලද තොරතුරුවලට අමතරව පිළිගත හැකි තොරතුරු ලබාගත හැකි වන්නේ ශුද්ධ ග්‍රන්ථ යැයි සලකනු ලබන ලෝකයේ ඇති ආගමික ග්‍රන්ථ අතුරින් පැරණිම ග්‍රන්ථය වූ **ඍග්වේදය** තුළ ඇති 1028 ක්වූ මන්ත්‍ර තුළිනි. එකල සමාජයේ මිනිසුන්ගේ ආගමික සිතුම් පැතුම් හා බැඳුණු සමාජීය තොරතුරු ගවේෂණය කිරීම සඳහා **ඍග්වේදයේ** තොරතුරු ප්‍රමාණවත්ද යන්න විමසා බැලීම පර්යේෂණයේ වැදගත්කමයි.

**පර්යේෂණ සීමා**

වේදකාලීන සමාජය පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා අනෙක් වේද ග්‍රන්ථ ද පිටිවහලක් වුව ද පැරණිම වේදය වශයෙන් ද අනෙක් වේද ග්‍රන්ථ **ඍග්වේදය** මත පවතින හෙයින් ද **ඍග්වේදය** මූලාශ්‍රය කොට ගෙන මෙම පර්යේෂණය සිදු කෙරේ. එහිදී **ඍග්වේදය** සම්බන්ධ ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍ර භාවිතා කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

**ඍග්වේදය** හා **සායනභාෂ්‍ය** ප්‍රාථමික මූලාශ්‍රය ලෙසත් එහි ඉංග්‍රීසි හා සිංහල පරිවර්තන, පර්යේෂණ ලිපි යනාදිය ද්විතීයික මූලාශ්‍ර ලෙස ගෙන ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ මේ පර්යේෂණය සිදු කෙරේ.

**උපන්‍යාසය**

වේදකාලීන සමාජය පිළිබඳ තොරතුරු ලබාගැනීමේදී **ඍග්වේදය** ප්‍රාමාණික මූලාශ්‍රයක්ය යන උපකල්පනය මත පදනම්ව සිට මෙකී පර්යේෂණය සිදු කරනු ලැබේ.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

**01. වේදය යනු කුමක්ද?**

වේද යන පදයෙහි නිර්වචනය දැනුම යන්නයි. √විද් ධාතුවට ''අච්'' නැමති නාමකරණ ප්‍රත්‍යය එකතුවෙයි. මෙහි ''එ'' යන්න ඉ අක්ෂරය හේතුවෙන් ධාතුවේ මුල් ස්වරය ගුණවීමෙන් ඇති වූවකි. එවිට ˃ වේද බවට පත්වෙයි. මුල්කාලීනව ''දැනුම'' ලෙස සැලකීමේ අරුතින් මෙම පදය යෙදුන ද පසුකාලීනව ''ශුද්ධ වූ දැනුම'' ලෙස සැලකිණි.

වේදය යනු කුමක්ද? මේ පිළිබඳ විවිධ නිර්වචන දක්නට ලැබෙයි.

**භවිෂ්‍යත් පුරාණයේ** සඳහන් වන්නක් ලෙස ශංකරාචාර්‍යවරයා විසින් **වේදාන්ත සූත්‍රයේ** 21.6 හි මෙසේ සඳහන් කරනු ලබයි.

''ඍග්යජුර් සාමාථර්වාඛ්‍යශ්ච භාරතං පඤ්චරාත්‍රකම්

මූලරාමායණං චෛව වෙද ඉත්‍යෙව ශබ්දිතා

පුරාණානි ච යානීහ වෛෂ්ණවානි විදො විදුඃ''

මෙයින් පැවසෙනුයේ **ඍග්, යජුර්, සාමන්** හා **අථර්වන්** වේද හතරත්, **මහාභාරතය** හෝ භරත මුණිහුගේ **නාට්‍ය ශාස්ත්‍රයත්, පංචරාත්‍රක** නම් නාට්‍යයත්, **මූල රාමායණය** ද, **වෛෂ්ණව පුරාණය** ද වේදය යනුවෙන් හැඳින්වෙන බවයි.

**ජෛමිනීය මීමංසාවේදී** ''මන්ත්‍රබ්‍රාහ්මණයොඃ වේද නාමධෙයම්'' යනුවෙන් මන්ත්‍ර හා බ්‍රාහ්මණ දෙකම වේද යනුවෙන් හඳුන්වනු ලැබේ. **මනුස්මෘතිය** වේදය ශ්‍රැතියට සමානවන බව සඳහන් කරයි. ශ්‍රැතිය යනු මහාබ්‍රහ්මයාගෙන් අසා දැනගත් දෙයයි.

''ශ්‍රැතිස්තු වෙදො විඥෙයො

ධර්ම ශාස්ත්‍රංතු වෙ ස්මෘතිඃ

තෙ සර්වාථේෂවමීමාංසේ‍යා

තාභ්‍යාම් ධර්මොහි නිර්බභෞ'' **(මනුඃ 2-6)**

වේදය ශ්‍රැතිය බව දැනගත යුතුයි. ධර්ම ස්මෘති යනු ධර්ම ශාස්ත්‍රයි. කිසිම ලෙසකින් සැකනොකළ යුතුයි. වේද නාමය යෙදීම පිළිබඳ වේදයට **භාෂ්‍ය** ලියූ සායන ආචාර්යතුමා **ඍග්වේද භාෂ්‍යයේදී** මෙසේ සඳහන් කරයි.

''ප්‍රත්‍යක්ෂෙණානුමිත්‍යාවා - යස්තුපායො න බුධ්‍යතෙ

ඒතද්විද්යන්ති වෙදෙන - තසමාත් වෙදස්‍ය වෙදතා''

ප්‍රත්‍යක්ෂ කිරීමෙන් හෝ අනුමාන කිරීමෙන් යම්කිසි වූ උපායක් (සත්‍යයක්) වටහා නොගන්නේ ද එය වේදයෙන් දැනගනියි. එනිසා වේදයට ''වේද'' යන නාමය ලැබේ.

වේදයන්ගේ ප්‍රමාණය සැලකීමේදී වේද සඳහා භාවිත ''ත්‍රයී'' යන නාමය විශේෂ අවධානයට යොමු කළ යුතුය. මෙය ''ත්‍රයී'' යන පදය සම්බන්ධයෙන් විවිධ නිර්වචන ඉදිරිපත් වී තිබේ.

I. වේද තුනක් ඇති බැවිනි.

II. ගද්‍ය-පද්‍ය-මිශ්‍ර යන තුනෙන් රචනා වී තිබීමෙනි.

III. මනුෂ්‍යයාගේ ජීවිතය, ක්‍රියාව හා බුද්ධිය යන අංශ තුන සාකච්ඡා වන බැවිනි.

මෙම නිර්වචන අතර පිළිගත් මතය වන්නේ

ග්‍රන්ථ තුනක් ඇති බැවින් ''ත්‍රයී'' වන බවයි. එම වේදත්‍රය නම් **ඍග්, යජුර්** හා **සාමන්** ය.

**කෞටිල්‍යගේ අර්ථශාස්ත්‍රයේදී** ඉතිහාස සහිත **අථර්ව වේදයත්** වේද ගණයට අයත්වන බව කියවේ. ප්‍රාචීන හා ප්‍රතිචීන විචාරකමත අනුව සලකා බැලීමේදී වේද හෙවත් වෛදික යන කොටසට පහත සඳහන් සියල්ල අයත්වන බව සැලකේ.

1. **සංහිතා** 2. **බ්‍රාහ්මණ**

3. **ආරණ්‍යක** 4. **උපනිෂද්**

5. **සූත්‍ර සාහිත්‍යය**

මෙහි සංහිතා යනුවෙන් සලකනු ලබන්නේ කුමක්ද?

සංහිතා - සං + √ධා - ස්ථාපනෙ

සං + √ධා - ත > හිත + ආ (මැනවින් සකස් කරන ලද) මැනවින් සකස් කරන ලද්දේ කුමක්ද? ඍග්, යජුර්, සාම, අථර්ව වේදයෝයි.

වේදයට අඩංගු සාහිත්‍යය කෙටියෙන් විමසමු. **ඍග්වේදය** - ''ඍච්'' යනු ස්තුති ගීතිකාවෝයි. (Panegyric Songs) ඍච් නැමති

ස්තුති ගීතිකා එකතු වී සූක්ත (Hymns) සෑදේ. සූක්ත යනුවෙන් කියවෙනුයේ ගීත කිහිපයක් එකතුවීමයි. එය එකම ඍෂි කෙනෙකුගේ රචනාවක් වෙයි.

''සම්පූර්ණ ඍෂි වාක්‍යංතු සූක්තමිත්‍යභිධීයතෙ''

එම සූක්ත අතුරින් යථාර්ථවත්ව ඡන්දස් අනුව පිළියෙළකර ඇත්තේ ''ඍග්'' වෙයි. ගීත යනු සාමයි. සෙසු සියල්ල යජුර් වේ.

''තෙෂාමෘග් යථාර්ථවශෙන පාද ව්‍යවස්ථා

ගීතීෂු සාමාඛ්‍යා - ශෙෂෙ යජුශ් ශබ්දඃ''

(**ජෛමිනී සූත්‍ර** 2:1:35, 37).

මෙහි **අථර්ව වේදය** ගැන සඳහන් නොවේ. එය පසුකල අනාර්‍ය්‍ය අදහස් පිළිගැනීමට සිදුවීමෙන් පසු එකතුකර ගන්නා ලද්ද කැයි විශ්වාස කෙරේ.

වේදයට අඩංගු සාහිත්‍යය විමසීමේදී ඍග්වේදය තුළ දෙවියන්ට ස්තුති කිරීමේ ගීතිකා අඩංගු වෙයි. පැරණිම වේදය ලෙස ද මෙය සම්භාවිතය. **යජුර්වේදය** යාගය පිළිබඳ වේදයයි. **ඍග්වේදයට** මෑතකාලීන කෘතියක් වන මෙහි විෂය පරාසය අතිශයින්ම සීමාසහිතය. **සාමවේදය** ගායනය පිළිබඳ වේදයයි. සාමවේදයේ 75% වඩා ඍග්වේද ගීතිකා ඇතුළත් වෙයි. **යජුර්-සාම වේද** ද්වය ඍග්වේදය මත යැපෙන වේදයන්ය. අථර්වවේදය තුළ අන්තර්ගත වනුයේ මන්ත්‍ර, තන්ත්‍රයන් පිළිබඳ දැනුමයි.

**බ්‍රාහ්මණ ග්‍රන්ථ** වනාහි චතුර්වේදයේ සඳහන් කළ යාග විධිය පිළිබඳව පූජකයින්ට අවවාද අනුශාසනා සපයන ග්‍රන්ථ සමූහයකි. ආරණ්‍යක යනු,

''ග්‍රාමයක නොව ආරණ්‍යයෙහි හෙවත් වනයෙහි හැදෑරිය යුතු වූ රහස් ධර්මයන් අඩංගු වූ ද, එවැනි ධර්මයන් නොදත් අයට හානිකර වූ ඉගැන්වීම්වලින් යුක්ත වූ ද ග්‍රන්ථ සමූහයක් ''ආරණ්‍යක'' යන නමින් හැඳින්වේ.''**(වෛදික සාහිත්‍යය, ජයදේව තිලකසිරි, 1958: 101).**

**උපනිෂද්යන්ගෙන්** නිරූපිත වනුයේ වේදවලින් දැක්වූ යාග ක්‍රමයට පරිබාහිර වූ දර්ශනවාදයන් සංග්‍රහයකි. රහසිගතව සමීපයෙහි සිට ඉගැන්විය යුතු ධර්මයන් ''රහස්‍යම්'' හෙවත් උපනිෂද් යනුවෙන් හැඳින්වේ.

වේදය අයත් කාලපරිච්ඡේදය ඉතා ඈතට දිවයන්නකි. වේදයේ කාලය පිළිබඳ විවිධ මත පවතී.

ඍග්වේදයේ පැරණිකම විමසීමේදී මූලික වශයෙන් ස්ථාවර දෙකක සිටීමට සිදුවේ.

I. ඍග්වේදය ග්‍රන්ථාරූඪවීමට පෙර අඩුම තරමේ සියවස් කිහිපයක්වත් මුඛපරපුරෙන් පැවතෙන්නට ඇත.

II. ඍග්වේදය ආරක්ෂාකර ගැනීම පිණිස විවිධ ස්මරණ උපාය යොදගනු ලැබ තිබීම.

**ඍග්වේදයේ** කාලය පිළිබඳ විවිධමත පවතී. ''ස්ථාවරත්වය පිළිබඳ කිසියම් සොයා බැලීමකින් අපට කිය හැකි එකම දෙය වන්නේ, ඒවායින් පැරණිතමයට ක්‍රි: පූ: 13 වන සියවසින් පසුවට දින නියම කළ නොහැකි බවයි.'' (**ඍග්වේද ගීතාවලී, නාරාවිල පැට්රික්, 1997: VIII**)

වේදයන්හි දැක්වූ කාලනිර්ණයේ යටත් පිරිසෙන් දැක්වූ කාලවකවානුව ඍග්වේද සමය ලෙස සලකනු ලැබේ. ඉන්දීය සාහිත්‍යය ඉතිහාසය ආරම්භ වනුයේ ඍග්වේදයෙනුයි. ඒ අනුව වින්ටර්නීට්ස් මහතා දක්වනු ලබන මතය මෙසේයි.

''ඉන්දීය සාහිත්‍යයේ ඉතිහාසය වූ කලී යටත් පිරිසෙයින් අවුරුදු 3000ක පමණ කාලයක් තුළ කථාවෙන් හා ලිඛිතයෙන් ද ප්‍රකාශකරන ලද මානසික කාර්‍යයෙක ඉතිහාසයයි.''(**ඉන්දීය සාහිත්‍ය ඉතිහාසය, 1-කාණ්ඩය, වින්ටර්නීට්ස්, එම්. 1967:1**).

Albretch weber පඬිවරයා පවසනුයේ වේදය අතිශයින් පුරාණ බවත්, කාලය නිශ්චිතව ඉදිරිපත් කළ නොහැකි බවත්ය. (**Albretch weber.1875:2**).

Maxmuller පඬිතුමා වේද කාලනිර්ණය සඳහා ඓතිහාසික මූලාශ්‍ර පදනම් කරගත යුතු බව පවසයි. (**Maxmuller. 1800:9-10**). ඔහු මේ සඳහා බුදුසමය උපයෝගීකර ගනියි. බුදුරදුන්ගේ කාලය ක්‍රි:පූ: 500 පමණ යැයි කියවේ. වේදය බුදුරදුන්ට පූර්ව රචිතය. එතුමා හැම සාහිත්‍යයක්ම අවුරුදු 200 බැගින් පසුපසට දමයි.

සංහිතා- 1200 - 1000 BC

බ්‍රාහ්මණ - 1000 BC

ආරණ්‍යක - 800 BC

උපනිෂද් - 600 BC

බුදුසමය - 500 BC

Schroeder පඬිවරයාගේ මතය ක්‍රි: පූ: 2000-1500 අතර වේදය ලියවෙන්නට ඇති බවයි. (**සේනානායක, ජී. එස්. බී, 1960: 7**). Gangadhara Tilak පඬිවරයාගේ අදහස ක්‍රි: පූ: 6000 පමණ යැයි අදහස් කරයි. Herman Jackobi පඬිවරයා ජ්‍යොතිර්විද්‍යාත්මක තොරතුරු පදනම් කරගනියි. (**සේනානායක, ජී. එස්. බී. 1960:7**). ඔහු යම් යම් යාගයන්හි නම් චාතුර්මාස්‍ය යාගය, පෞර්ණමී යාගය වැනි යාග සිද්ධ වූ කාලය නැකැත් ක්‍රමය අනුව බලා වේදය ක්‍රි: පූ: 3000ට පෙර යැයි නිර්ණය කරයි. චන්‍ද්‍රමාස අනුව ඇති නැකැත් 27න් කැතිනැකත විශ්වයෙහි පිහිටීම වැනි තොරතුරු බ්‍රාහ්මණ ග්‍රන්ථවල හමුවේ.

බ්‍යුලර් පඬිවරයා පවසනුයේ (**සේනානායක, ජී. එස්. බී. 1960:7**). වෛදික ආර්‍යයන් භාරතයට පැමිණෙනුයේ ස්වදේශීයයන් සමග සටනට එළඹීමෙනි. එසේ සටන් කරමින් සෙමින් දකුණු ප්‍රදේශයට සංක්‍රමණය වීම අනුව විශාල කාලයක් ගතවීම නිසා වේද මුඛපරම්පරාවෙන් පැවත ග්‍රන්ථාරූඪවීම සඳහා විශාල කාලයක් ගතවන්නට ඇත යැයි ඔහු කල්පනා කරයි. ඔහුගේ මතය ක්‍රි: පූ: 1500ත් 1200ත් අතර කාලයේ ලියවෙන්නට ඇති බවයි. ක්‍රි: පූ: 800දී පමණ ආර්‍යයන්ගේ ගෝත්‍ර කිහිපයක් දක්ෂිණ ඉන්දියාවේ පැවැති බවට සාධක හමුවීම මොහු තවත් සාක්ෂියක් ලෙස දක්වයි.

I. වේදයන් අතර ඍග්වේදය

ස්තුති ගීතිකා (Panegyric Songs) අඩංගු වේදය **ඍග්වේදයයි.** අනෙක් වේද අතුරින් පැරණිතම වේදයයි. එහි පැරණි බවට සාධක මෙසේ දැක්විය හැකිය.

1. භාෂාවේ පවත්නා ඉපැරණිම ප්‍රයෝග.
2. පුද පූජාවල නොදියුණු ස්වරූපයක් අඩංගු වීම.
3. ඍග්වේදයේ නිරූපිත සමාජය නොදියුණු බව.
4. පැරණි පර්සියාවේ ආගම වූ ශරතුස්ත්‍ර ආගමේ හිටපු දෙවිවරුන්ගෙන් සමහරක් ඍග්වේදයේ දක්නට ලැබීම. ඉන්ද්‍ර, අග්නි, මිත්‍ර, වරුණ, නාසත්‍ය ආදී දෙවිවරු නිදසුන්ය.
5. අනාර්‍ය ජනතාවගේ ආගමේ දෙවිවරුන් සමහරක් ඍග්වේද ආගම තුළ දැකගත හැකිවීම.
6. අනෙක් වේද තුන ඍග්වේදය මත පදනම් වීම. **යජුර්වේදයේ** 70% ඍග්වේද කොටස්ය. සාම වේද ගීතිකා වැඩි ප්‍රමාණයක් **ඍග්වේදයෙන්** උපුටාගෙන තිබේ.
7. ඍග්වේද ආගමේ කියවෙන ආගමික, දාර්ශනික සම්ප්‍රදායන්වල බීජ අවස්ථාව දක්නට ලැබීම.
8. ඍග්වේදයේ කාලයට සමකාලීන වශයෙන් සැලකිය හැකි පුරාවිද්‍යාත්මක සාධක හමුවීම. ඒවා පුරාණවීම.

ඍග්වේදයේ විභේදනය ප්‍රධාන වශයෙන් දෙකකි.

I. මණ්ඩල වශයෙන් බෙදා දැක්වීම.

II. අෂ්ටක වශයෙන් බෙදා දැක්වීම.

පෙරපර දෙදිග වියතුන් මණ්ඩල වශයෙන් බෙදීම ප්‍රශස්ත ලෙස සලකනු ලබයි. ඍග්වේදයේ මණ්ඩල 10 කි. අෂ්ටක වශයෙන් බෙදීමේදී ප්‍රධාන අටක් ඇත. මෙහි එක් ආධ්‍යායයක් වර්ග 2006 කට බෙදයි. එක් වර්ගයකට පද්‍ය පහකි. සම්පූර්ණ ඍෂිවාක්‍යයක්

සූක්තයකි. එවැනි සූක්ත හෙවත් පද්‍ය ගොනු 5-20 අතර ප්‍රමාණයෙන් එකතු වීමෙන් සූක්තයක් රචිතය. වාස්කල ශාඛාවට අයත් ඍග්වේදයේ සූක්ත 1028කි. පද්‍ය 10600 පමණ ඇත.

ශාකල ශාඛාවට අයත් ඍග්වේදයේ සූක්ත 1039කි. මණ්ඩල 10ය ඍෂිකුල 10ක් විසින් රචිතය. ඒ ඒ මණ්ඩල රචිත ඍෂිකුල හා ඒවායෙහි සූක්ත සංඛ්‍යාව මෙසේය.

| මණ්ඩලය | ඍෂිකුල | සූක්ත සංඛ්‍යාව |
|---|---|---|
| I. | මධුච්ඡන්ද | 191 |
| II. | ගෘත්සමද | 43 |
| III. | විශ්වාමිත්‍ර | 62 |
| IV. | වාමදේව | 58 |
| V. | අත්‍රී | 87 |
| VI. | භාරද්වාජ | 75 |
| VII. | වශිෂ්ඨ | 104 |
| VIII. | කණ්ව-අඞ්ගීරස් | 114 |
| IX. | නිශ්චිත ඍෂිකුලයක් නැත | 114 |
| X. | නිශ්චිත ඍෂිකුලයක් නැත | 191 |

ඍග්වේද සූක්තයන්හි අන්තර්ගතය තුළ ඇත්තේ කවරක්ද යන්න මාතෘකා ලෙස පහත දැක්වන ප්‍රකාශන තුළින් පැහැදිලි වෙයි.

1. විෂ්මයාර්ථවත් ප්‍රකාශන.
2. ප්‍රීතියදනවන ප්‍රකාශන.
3. ත්‍රාසය හඟවන ප්‍රකාශන.

4. ගෞරවය දැක්වීම.

5. ප්‍රශංසාත්මක ප්‍රකාශන.

6. ශංසයාර්ථක ප්‍රකාශන.

7. පාපොච්චාරණ ස්වරූපයේ ප්‍රකාශය.

8. කුතුහලය දනවන ප්‍රකාශන.

9. අසරණ බව හා පීඩිතබව හඟවන ප්‍රකාශන.

10. ඉච්ඡා ස්වරූපය.

**ඍග්වේදයේ** අන්තර්ගත මෙම ප්‍රකාශනවලින් පැහැදිලි වනුයේ වෛදික ආර්යයා තුළ ඇතිවුණු ත්‍රාසය, භීතිය, සතුට, කුතුහලය ඉදිරිපත් වූ ආකාරයයි.

**02. වේදකාල සමාජය (ඍග්වේදයෙන් පිළිබිඹු වන අයුරු)**

**ආර්ය සංක්‍රමණය හා එකල පරිසරය** -

ආර්යයෝ ඉරානය දෙස සිට කයිබර් දුර්ගය හරහා පැමිණ වයඹ දිග ඉන්දියාවේ පදිංචි වූහ. එක් තැනක වාසය නොකළ ඔවුහු සංචාරක දිවියක් ගත කළහ. ඔවුන්ගෙන් සමහරක් ස්ථිර පදිංචිකාරයන් ලෙස ගෙවල් තනාගෙන ගම් පිහිටුවාගෙන ලක්ෂණ ප්‍රාකාර සහිත නගර ඉදිකරගෙන විසූ බැව් ඍග්වේදයේ II. 41, I, IV, 30, 3, V, 62 ආදී ගීතිකාවලින් පෙනේ. **(සේනානායක, ජී. එස්. බී. 1960:23).**

ඍග්වේද මන්ත්‍ර රචනාවන සමයෙහි ආර්යයෝ ඉන්දියාව පුරාම පැතිරී නොසිටියහ. **ඍග්වේදයේ** විශේෂයෙන් සඳහන් වන්නේ සින්ධු නදිය අවට, පඤ්චනදී නොහොත් පඤ්ජාබ් ප්‍රදේශය පිළිබඳ විස්තරයෝයි. විතස්තා, අසික්නී, පරුෂ්ණී, විෂාම්, ශුතුද්‍රි යන ගංගා පහ නිසා මෙම නම ලැබී ඇත. එම ප්‍රදේශය ගංගාවලින් වටවූ ඉතා සරුසාර ප්‍රදේශයක් විය. එහි පදිංචි වූ ඔවුහු ක්‍රමයෙන් දකුණු දෙසට ඇදෙන්නට වූහ.

ආර්‍යයන් හට භාරතයේදී අභියෝග එල්ල වූයේ අනාර්‍ය වූ ස්වදේශිකයන් ගෙනි. ස්වදේශිකයන් හැඳින්වීම සඳහා කාල වාර්ණික, දාස වාර්ණික, ශිෂ්ණදෙවාඃ, මෘධ්වාචි, අනාසාඃ, දස්‍යු ආදී නම් භාවිතය. ඔවුන් සඳහා මෙම නම් යොදන ලද්දේ ලිංග වන්දනාකරන ලද, කළු හමක් ඇති, දාසයන් ලෙස පහත්කොට සලකා ඉතා පහත් කුලයට අයත්, රළු වචන පවසන, පැතලි නාසයක් සහිත දාස යන බව හේතුන් නිසාය. ඉන්ද්‍ර දේවතාවා ආර්‍යයන්ගේ සතුරන්ගෙන් දහසක් අත-පය බැඳ දුන් බවත්, තවත් තිස්දහසක් පමණ ජීවිතක්ෂයට පත්කළ බවත් ඉන්ද්‍ර දෙවියාට ස්තුති වශයෙන් එක් මන්ත්‍රයකින් කියවේ. දෙපක්ෂය අතර පැවති බලවත් වෙනස වර්ණ භේදයයි. මෙය පසුකළ ඇති වූ කුල භේදයේ බීජය විය.

**ඍග්වේදයේ** සඳහන් ගංගාවන්ගෙන් සින්ධු නදිය හා සරස්වතී නදිය වැදගත්ය. **ඍග්වේදයේ** 10 වන මණ්ඩලයේ 75 සූක්තයේ සරස්වතී නදියේ වර්ණනයක් එයි. ''සප්තසින්ධවඃ'' යැයි ගංගා හතක් ගැනද සඳහන් වෙයි. සමුද්‍රය ගැන හැඳින්වීමක් ප්‍රධාන වශයෙන් නැත. ''ඒ අනුව අපට පෙනෙන්නේ ''සින්ධු'' ගඟ අසල වෛදික ආර්‍යයන්ගේ ප්‍රධාන වාසස්ථානය වූ බවයි. සින්ධු ගං ඉවුරු දෙකෙහි එකල විශාල ජනකායක් වාසය කළ බවද හැඟීයයි. ඒ ප්‍රධාන ගඟට වෙනත් ශාඛා ගංගාවන්ගේ ජලය ගලා ඒම නිසා පළල් වූ ඒ නදියෙහි නැව් සහ විශාල ඔරු-පාරු ගමනාගමනය පිණිස යොදන ලදැයි වෛදික ගී අනුව විශ්වාස කළ හැකිය.'' **(තිලකසිරි, ජයදේව.1958:31).**

**ඍග්වේදයේ** සඳහන් පර්වත අතුරින් ''හිමවන්තඃ'' ප්‍රධානය. ගිරිශිඛර අතුරින් සෝමවැලෙහි උත්පත්ති ස්ථානය යැයි සඳහන් වූ මූජවත් නම් ගිරිමුදුන සඳහන් වෙයි.

**ඍග්වේදයේ** සඳහන් ගහකොළ හා සත්ව වර්ග අනුව ආර්‍යයන් පංජාබය අවට විසූ බව ඔප්පු වෙයි. සෝම පැළය කඳුකර පෙදෙස්හි සුලභ ලෙස වැවෙතැයි කියවෙන නමුත් බ්‍රාහ්මණ යුගයේදී මෙය මහත් දුරකින් ගෙනා බව සඳහන් වෙයි. ඍග්වේද කාලීන ගොවියන් ''යව'' වැවීම කරන ලදහ. සහල් ගැන **ඍග්වේදයේ** සඳහන් නොවෙයි. අථර්ව වේදයෙහි ''ව්‍රීහි'' යැයි කියවේ. විශාල වෘක්ෂයන් අතුරෙන් ඇසතුගස ගැන සඳහන් වෙයි. න්‍යග්‍රෝධ වෘක්ෂය ගැන ඍග්වේදයේ

සඳහන් නොවෙයි. අථර්වවේදයෙහි දෙවරක් පමණක් සඳහන් වන බව ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා පවසයි.

ඍග්වේද සමයේ විසූ සතුන් අතර සිංහයා ගැන සඳහන් වෙයි. සිංහයන් වනගත පර්වත ප්‍රාන්තයන්හි ගර්ජනා කරමින් වාසය කරතැයි වර්ණනා කෙරේ. බෙංගාලයේ වගුරුබිම්වල විසූ දිවියා ගැන **ඍග්වේදයේ** සඳහන් නොවේ. ඒ වනවිට ආර්‍යයෝ එම ප්‍රදේශවලට සංක්‍රමණය වී නොසිටියෝය. **යජුර්** හා **අථර්ව සංහිතාවල** දිවියා ගැන සඳහන් වෙයි. මේ අනුව යජුර්-අථර්ව යුග වනවිට ක්‍රමයෙන් පෙරදිග දෙසට සංක්‍රමණය වන්නට ඇත. ඇතා ගැන **ඍග්වේදයේ** සඳහන් වෙයි. එහි ඌට දී ඇති නම ''හසතින්-මෘගඃ'' නොහොත් ''අතක් ඇති සතා'' යන්නයි. වෘකයා ගැනද සඳහන්වන අතර බල්ලන් ලවා ඌරන් දඩයම් කල බව සඳහන් වෙයි. බල්ලා ගෘහශ්‍රිත සත්වයෙකු වශයෙන් සිට ඇත. කුළු මීමුන් හීලෑකල බව මන්ත්‍රවල සඳහන් වන අතර ගවයන්, එළුවන්, බැටළුවන් හා කොටළුවන්, බල්ලන් වැනි සතුන් ගෙවල්වල ඇතිකරන ලදහ.

**ආර්‍යයන්ගේ ආගම**

ආර්‍යයන්ගේ ආගම මූලික වශයෙන් ස්වභාවවාදී වූවකි. ඔවුහු මිනිසාට කල නොහැකි සිද්ධිවලට තම නිරීක්ෂණය යොමු කෙරිණි. මානුෂීය ශක්තිය ඉක්මවා ගිය මෙම ස්වභාවයන් මොනවාදැයි දේවත්වයට නගන ලද එම වස්තූන්ගෙන් පැහැදිලි වෙයි. ඍග්වේදයේ දෙවියන් නිර්මාණය කෙරෙන ප්‍රධාන ක්‍රමවේද තුනකි.

1. ප්‍රාණිවාදය (Animism)
2. ඉෂ්ඨදේවවාදය (Fetishism)
3. මනුෂ්‍යත්වාරෝපණවාදය (Anthropomorphism)

1. කිසියම් ස්වභාවික වස්තුවකට හෝ සංසිද්ධියකට ප්‍රාණයක් ඇති බව සැලකීමයි.

උදාඃ- සෝම (එනම් පැළෑටිය), ග්‍රාවාණඃ (ඇඹරුම් ගල)

2. තමන්ට එදිනෙදා කටයුතුවලට උදව්වන උපකාරීවන යම් යම් වස්තූන්ගේ අද්විතීය බලය දේවත්වයට නැගීමයි.

උදා:- අග්නි (ගින්න), වායු (සුළඟ), අපාංනපාත් (ජලය)

3. සමහර වස්තුවලට මනුෂ්‍ය රූපකායක් සහ ගතිගුණ තිබෙන බව විශ්වාස කිරීම.

උදා:- ඉන්ද්‍ර (අකුණු ගැසීම)

මෙම ක්‍රමවේදත්‍රයෙන් වෛදික ආගම බිහිවුණි. ඍග්වේදයේ ඇත්තේ මෙලෙස බිහිවූ දෙවියන් උදෙසා ස්තුති ගීතිකා ගායනයන්ය. **ඍග්වේදයේ** X වැනි මණ්ඩලයේ 52 වැනි සුක්තයේ 6 වැනි ගීතිකාවෙන් දෙවිවරුන් 3339ක් ගැන සඳහන් වෙයි.

''ත්‍රීණි ශතා ත්‍රි සහස්‍රාණ්‍යග්නිං ත්‍රිංශච්ච දෙවා නව චාසපර්යන්?

ඖක්ෂන්ඝෘ තෛරස්තෘණන්බර්හිරස්මා ආදිදධොතාරං න්‍යසාදයනත''

වෛදික ආගමෙහි මූලාරම්භය මෙකී දේවවාදයයි.

- වේදකාලීන ජීවනවෘත්තීන්

වේදකාලීන ආර්යයාගේ ජීවන වෘත්තිය ප්‍රධාන වශයෙන් ගව පාලනයයි. කෘෂිකර්මාන්තය ද ඒ හා වැදගත්කමක් සහිතව කළ බැව් ඍග්වේදයේ I-3,8, I-4,3, I-9,15, I-4,57, VIII-22,1 යන ගීතිකාවල සඳහන් වෙයි. **(සේනානායක, ජී. එස්. බී. 1960:24).**

සූක්ත කිහිපයකම ඉන්ද්‍රාදී දෙවිවරුන්ගෙන් අයදිනුයේ ගව, අශ්ව, එළු, බැටළු සහ කිරි එළදෙනුන් රැකදෙන ලෙසය. යාග කරණාදිය සඳහා දක්ෂිණාව වශයෙන් බෙහෙවින් දෙන ලද්දේත් දෙන්නුය. යුධ කිරීමෙන් පසු පරාජිතයන්ගේ ගවයන් ජයග්‍රාහකයන්ට අත්කොට ගතහැකි හෙයින් යුද්ධයට ''ගවිෂ්ටි'' යන නාමය ද ව්‍යවහාර විය. තණබිමින් තණ කා වසුපැටියා ලෙවකමින් ආපසු එන ධේනුව වෛදික ආර්යයාට ඉතා ප්‍රියංකර දර්ශනයක් විය. වසුපැටියන් සොයමින් කිරිදෙනුන් නැගූ හඬ ආර්ය මනුෂ්‍යයා ප්‍රීතියෙන් කුල්මත් කිරීමට සමත්විය. **(හෙට්ටිආරච්චි, ඩී. ඊ. 1946:11).** පසුකාලයෙහි නොනැසිය යුක්තිය යන අර්ථයෙන් ''අඝ්න්‍යා'' යනු ධෙනු පර්යාය පදයක් විය.

ආයර්‍යයන්ගෙන් ඇතැමෙක් දඩයම් කිරීමෙහි යෙදුණෝය. එය උසස් ජීවන වෘත්තිය කැයි සඳහන් නොවේ. රැකී රක්ෂා අතුරෙන් ලී වැඩ හෙවත් වඩුවැඩ කිරීම, රථචක්‍ර, යුද්ධ රථ තැනීම එකල තිබී ඇත. තවද සම්වැඩකරුවෝ, යකඩවැඩකරුවෝ, කුඹල් කර්මාන්තකරුවෝ යනාදී විවිධ කාර්මිකයෝ ඔවුන් අතර විය. නැව්, ඔරු, පාරු නිෂ්පාදන කරන පිරිස් ද විසූ බව කියවේ. වෙළඳාම පැරණි සෑම රටකම පැවති බඩු හුවමාරු කිරීමේ ක්‍රමය අනුව සිදුවී ඇත. පැදුරුවිවීම, රෙදිවිවීම සහ ගෙතීම ස්ත්‍රීහු සිදුකළ කර්මාන්තයෝයි. ඔවුහු බැටළු ලොම්වලින් නොයෙක් දේ නිෂ්පාදනය කළහ.

**ආයර්‍ය සංස්කෘතිය**

ආයර්‍යයන්ගේ ප්‍රධාන ආහාරය ලෙස මස් හා කිරි භාවිතාකරන ලදී. ගව දෙනුන් එතරම් උසස්කොට සලකා කටයුතුකරන ලද්දේ ඔවුන්ගෙන් පස්ගෝ රස ලද බැවිනි. ආහාර අතර ගොධූම (තිරිඟු) ව්‍රීහී (වී), පූප (රස කැවිලි) ආදිය ද පානය කිරීම සඳහා කිරි හා සෝමපානය ද යොදාගෙන ඇත. මත්පැන් පානය, සෝමපානය ජනප්‍රියව පැවතී ඇත.

ඇඳුම්-පැළඳුම් වශයෙන් විශේෂයෙන් ස්ත්‍රී-පුරුෂ දෙපක්ෂයම මාල, වළලු, නූපුර ආදී රන්රිදීවලින් තැනූ ආභරණ පැළඳි බැව් ඍග්වේදයේ IV-37.2, V-35,1, V-58-1 යන ගීතිකාවල සඳහන් වෙයි. **(සේනානායක, ජී. එස්. බී. 1960:25).** හිරණ්‍ය (රන්), රජත (රිදී), ත්‍රපු (ටින්), අයස් (යකඩ), ශිප්‍ර (ලෝකඩ) යනාදියෙන් සාදන ලද ආභරණ පළඳා ඇත. උඩුකය හා යටිකය වැසීම සඳහා විවිධ වස්ත්‍ර යොදාගත්හ.

පවුල සමාජයේ පදනම විය. ගෘහපතියා වූ පියා පවුලේ ප්‍රධානියා විය. පියා මූලික වීම නිසා ස්ත්‍රී පක්ෂයට වඩා පුරුෂ පක්ෂය සාමාජික අයිතිවාසිකම් හිමිකර ගත්තේය. ස්ත්‍රීන් විවාහයට පෙර පියාගේත්, විවාහයට පසු සැමියාගේත් ආරක්ෂාව ඇතිව ජීවත්ව සිටි බව පෙනේ. ඍග්වේදයේ විවාහක්‍රම කිහිපයක් ගැන සඳහන් වෙයි. එයින් බ්‍රහ්ම, අසුර, ස්වයංවර යන තුන පොදුක්‍රම වශයෙන් පැවතුණු බැව් X-85, 22, X-27,15 වැනි ඍග්වේද ගීතිකාවල සඳහන් වෙයි.

වංශය ගෙන යාම පිරිමි පාර්ශ්වයෙන්ම සිදුවිය යුතු නිසා පුතුන් ලැබීම වඩාත් භාග්‍යයක් කොට සැලකිණි. බොහෝ ඍග්වේද ගීතිකාවලින් දෙවියන්ගෙන් ඉල්ලා සිටිනුයේ බලවන්ත, වංශය රැකගෙන යැමට සුදුසු පුතුන් ලබාදෙන ලෙසයි. දූවරු ලැබීමේ ආශාවක් ගැන නොකියවේ. ගැහැණු දරුවන් ලැබීම අභාග්‍යයක් කොට අථර්ව වේදයේ සඳහන් වෙයි. දූවරු උපන් විට ඔවුන් මැරෙන්නට ඉවත දමන ලදැයි යජුර්වේදයෙහි සඳහන් වෙයි.

පරස්ත්‍රී සේවනය හා කන්‍යාපහරණය බරපතළ අපරාධ සේ සැලකීම එකල සමාජය ශිෂ්ටසම්පන්නව පැවති බවට සාධකයකි. , එම සමාජයේ ශිෂ්ට සම්මත සමාජ චාරිත්‍ර, නීතිරීති ආදිය පැවති බව පෙනේ. ඔවුන්ගේ චාරිත්‍ර වාරිත්‍ර අතර විචිත්‍ර විවාහ මංගල උත්සව වර්ණනාවක් ඍග්:X-85 සූර්‍යා සූක්තයේ එයි. අවමංගල චාරිත්‍ර පිළිබඳ විස්තරවන යම-යමී සූක්තයද වැදගත්ය.

**විනෝදායන මාර්ග**

ඔවුන්ගේ විශේෂ ක්‍රීඩාවන් අතර දාදු ක්‍රීඩාව, කරත්ත රේස් ජනප්‍රියව පැවතී ඇත. තවද නර්තනය හා ගායනය එකළ පැවති අතර කාන්තාවන්ගේ නැටුම් විශේෂයි. වාදනය සඳහා දුන්දුභී, කර්කරි, වීණා ආදී වාද්‍ය භාණ්ඩ යොදාගෙන ඇත.

මෙලෙස දැක්වූයේ **ඍග්වේදයෙන්** නිරූපණය වන තත්කාලීන සමාජය පිළිබඳවය. මෙම තොරතුරු බොහෝවක්ම ස්තුතිගීතිකාවන් අතුරින්ම ලබාගත් සාධකයෝයි.

**03. ඍග්වේද මූලාශ්‍රය ප්‍රාමාණික ද?**

වේද කාලීන සමාජය පිළිබඳ තොරතුරු ලබාගැනීමේදී **ඍග්වේදය** ප්‍රමාණික මූලාශ්‍රයක් වශයෙන් පිළිගත හැකිද? යන්න විද්වතුන් අතර මතභේදයට හේතුවී තිබෙන්නකි. මෙහිදී ප්‍රමාණික මූලාශ්‍රයක් වශයෙන් සැළකීමට නොහැකි මට්ටමේ ගැටලු කිහිපයක් මතුවෙයි.

1. මූලාශ්‍රය ලිඛිත මාධ්‍යයක් වීම.

2. කලින් කලට සංස්කරණය කරන ලද මූලාශ්‍රයක් වීම.

3. ආගමික හා දාර්ශනික මූලාශ්‍රයක් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ භාවිතවීම. (ආගමික දෘෂ්ටියට අනුව හැඩගස්වන ලද අදහස් ඉදිරිපත් වීම)

4. **ඍග්වේදය** අතිශයින් පුරාණවීම හා අනෙකුත් වේදයන් ඒ මත රඳා පැවතීම.

5. ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් රචනා කිරීමට ඍග්වේද කතුවරුන් නොපෙළඹීම.

**ඍග්වේදය** ග්‍රන්ථාරූඪ වීම මෑත කාලීනය. එය ක්‍රි: පූ: 600 තරම් මෑතට දැමීමට විචාරකයෝ කැමැත්තෝය. එහි ඇතුළත් සමාජ වටපිටාව වූ කලී ක්‍රි: පූ: 1500 පමණ එහා මිස මෑතකාලීන නොවේ. මුල්කාලීනව මුඛපරම්පරාවෙන් පැවත ආ මෙම සාහිත්‍ය ග්‍රන්ථාරූඪ වීම අතර කාලයේ වෙනසක් ඇත. විවිධ ස්මරණ උපාය මගින් පැවතගෙන ඒමේදී ඒ ඒ ඍෂිකුල විසින් තම අභිමතය පරිදි විවිධ වූ කොටස් එකතු කිරීමත්, අනවශ්‍ය යැයි හැඟෙන කොටස් ඉවත්කිරීමත් සිදුවන්නට ඇත. අනෙක් කරුණ මූලාශ්‍රයක් වශයෙන් ලිඛිත මාධ්‍යයෙන් පැවතීමත් ගැටලු ඇති කරවන්නකි. විශේෂයෙන් ලේඛනගත වීමේදී එම ලේඛකයන්ට තත්කාලීන සමාජ-පරිසර බලපෑම නිතැතින්ම ඇතිවන්නකි.

ඍග්වේදය කලින් කලට සංස්කරණය කරන ලද්දකි. එහි පැරණි අදහස් මෙන්ම නව්‍ය වූ අදහස් ද ගැබ්වී ඇත. විවිධ වූ සම්ප්‍රදායයන්ට අයත් ඍග්වේද සංස්කරණ පැවතී ඇති අතර මධුච්ඡන්ද ඍෂිකුලයේ ඍග්වේද සංස්කරණය අද සම්භාවිතව පවතී.

''ඒවා ඉන්දියාවට යන්තමින් හඳුන්වාදිය හැකිව තිබුණේ ක්‍රි: පූ: 700ට පෙර පමණේදීයි. මේ කුල පරම්පරා සතු සූක්ත, නිරන්තර එකතු කිරීම් සහිතව ඍග්වේදයේ ආදිතම සංග්‍රහ ආකෘතිය ලෙස පිළිග ැනෙන තුරු එක්රැස් කරන ලදී. ඉක්බිති ක්‍රි: පූ: 600දී පමණ රචිත සේ පෙනෙන සංහිතා පාඨ පිළිබඳ සූත්‍ර නම් වූ ග්‍රන්ථ බිහිවිය. ඒ බ්‍රාහ්මණ ග්‍රන්ථ සමයට පසුව, නමුත් උපනිෂද් සමයට පෙරාතුවය.'' **(පැට්රික්, නාරාවිල. 1997: X).**

ඍග්වේද සූක්තවල නව්‍ය වූ ප්‍රවේශයක් ඇතැයි අප මුලදී සඳහන් කෙළෙමු. මෙහි පැරණිතම සූක්තයන් වශයෙන් සලකනු ලබන්නේ 2 වැන්නේ සිට 7 වැන්න දක්වා වූ මණ්ඩලයන්ය. 1-8-9-10 මණ්ඩල මෑත කාලීන සංග්‍රහයන්ය.

**ඍග්වේදයෙහි** ඇතුළත් සූක්ත සමූහය මණ්ඩල වශයෙන් දහයකට බෙදා දැක්වේ. එයින් 2, 3, 4, 5, 6 හා 7 මණ්ඩල පුරාණ තම ඍෂිකුලවලට අයත් බව විචාරකයන්ගේ පිළිගැනීමයි. සෙසු මණ්ඩල 4 න් 10 වන මණ්ඩලය සියල්ලටම පසුව එකතු වූ ''නව'' සූක්ත සංග්‍රහයක් හැටියට සැලකේ.''**(ප්‍රශස්ති. 2002: 138).**

මෙම කරුණු මත **ඍග්වේදය** තත්කාලීන සමාජය පිළිබඳ පැහැදිලි අඛණ්ඩ වූ මූලාශ්‍රයක් වශයෙන් සැලකීමට නොහැකි තරම්ය.

**සමාලෝචනය**

ඓතිහාසික මූලාශ්‍රයකට වඩා ආගමික හා දාර්ශනික මූලාශ්‍රයක් වශයෙන් **ඍග්වේදය** සැලකිය හැකිය. ඍග්වේදය සංග්‍රහ කළ ඍෂිවරුන් වෛදික ආගම හා දාර්ශනික චින්තාවන් සංග්‍රහ කිරීම අරමුණු කරගත් පිරිසකි. ඔවුන්ට එකල සමාජ තොරතුරු ඉදිරිපත් කිරීමට අවශ්‍යතාවක් නොවීය. දෙවියන් උදෙසා කරනු ලබන පූජාචාරිත්‍ර හා මන්ත්‍ර ගායනයන් සුරැකීමත්, ශුද්ධ වූ ආගමික ග්‍රන්ථයන් නිර්මාණය කිරීමත් ඔවුන්ගේ අවශ්‍යතාව වී ඇත. ඒ අනුව එම ඍෂිවරුන්ගේ ආගමික දෘෂ්ටිය හා දාර්ශනික නම්‍යතාවන් හෙළිකරන සූක්ත තුළින් අපට ඓතිහාසික තොරතුරු සොයාගැනීමට සිදුවීම ගැටලු සහිතය.

**ඍග්වේදය** මත අනෙක් **යජුර්** හා **සාම වේද** රඳා පවතී. **යජුර් වේදයෙහි** ඇතුළත් වනුයේ **ඍග්වේදයෙන්** පැහැදිලි කළ යාග පූජා කර්මය වැඩි දියුණු කිරීමකි. එහිදී **ඍග්වේදයෙන්** උපුටාගත් මන්ත්‍ර සූත්‍ර විශාල සංඛ්‍යාවක් දක්නට ලැබෙයි. සාමවේදයෙහි 75% ඍග්වේද සූක්තයෝයි. චතුර්වේදයට අනුව යුගවලට බෙදන්නේ නම් සුවිශේෂී සාමාජික තොරතුරු යම් තරමකට හෝ අඩංගු වී ඇත්තේ ඍග්වේද හා අථර්ව වේද යුගයේදී පමණි. අනෙක් වේදද්වය **ඍග්වේදය** මතම පදනම් වීම තුළ එම යුගවල සමාජ තොරතුරු ලබාගත නොහැකි තත්ත්වයක් දක්නට ලැබෙයි.

ඍග්වේදය රචනා කිරීමේ අරමුණ ඓතිහාසික තොරතුරු ඉදිරිපත් කිරීම නොවේ. මෙහි සූක්ත රචනා කිරීමේ පරමාර්ථ මෙලෙස ගොනුකොට දැක්විය හැකිය.

1. දෙවියන්ට ස්තුති කිරීම.
2. ආශ්චර්යවත් ස්වභාවික සංසිද්ධි කෙරෙහි තමන්ගේ විස්මය ප්‍රකාශ කිරීම.
3. ආශ්චර්යමත් බලවේග කෙරෙන් වස්තු සම්පත් ඉල්ලා සිටීම.
4. ලෝකය සහ එහි භෞතික වස්තු හඳුනා ගැනීමට තැත් කිරීම.
5. ජීවිතයේදී මුහුණදෙන ගැටලු සහගත අවස්ථා ප්‍රකාශ කිරීම.

මෙහිදී ඓතිහාසික තොරතුරු ඉදිරිපත් කිරීමේ කිසිදු අරමුණක් නොමැත. ආගමික හා ස්වභාවික සංසිද්ධි පිළිබඳ ඉදිරිපත් කිරීම මෙහි අරමුණ වී ඇත්තේ.

මෙම සාධක මත ඍග්වේදය ප්‍රාමාණික මූලාශ්‍රයක් වශයෙන් පිළිගැනීම විවාදාපන්නය. ආගමික හා දාර්ශනික මූලාශ්‍රයන් ඉදිරිපත් කිරීමේදී තත්කාලීන සමාජ බලපෑම නිතැතින්ම එන්නකි. ඒ අනුව තත්කාලීන සමාජ තොරතුරු ද මෙම සූක්තවල ඇතුළත් වීම වැළැක්විය නොහැක්කකි. මෙම තොරතුරු මතත්, පුරාවිද්‍යාත්මකව සොයාගෙන ඇති සාධක මතත් තත් සමාජ තොරතුරු ගොනු කොට ගැනීමට අපහසු නොවේ. වෂී දහස් ගණනකට එහා මිනිස් සිත ක්‍රියාකළ හැටි පැහැදිලි කරන මෙම වේද සූක්ත හැදෑරීමේ වටිනාකම ඉන්දීය දර්ශන ග්‍රන්ථයේදී රාධා ක්‍රිෂ්ණන් මහතා මෙසේ දක්වයි. එයින්ම මේ නිබන්ධනය හමාර කරමු.

''ඉන්දියානු චින්තනය පිළිබඳ කිසියම් සෑහෙන විස්තරයක් දීමට ඍග්වේද සූක්ත හැදෑරීම නොකරම බැරි දෙයකි. බාගෙට හැදුණු, පුරාවෘත්ත යැයි හෝ ගොරෝසු උපමාකථා යැයි හෝ අඳුරේ අතපත ගෑම් යැයි හෝ අපරිණත රචනා යැයි හෝ අප ඒ සූත්තයන් ගැන

මොනවා සිතුවත්, ඉන්දු ආයර්‍යයන්ගේ පසුකල චාරිත්‍රයන්ගේ හා දර්ශනයන්ගේ ප්‍රභව ස්ථානය වූයේ ඒවාය. අනන්තර චින්තනය නිසි ලෙස වටහා ගැනීමට ඒවා හැදෑරීම අවශ්‍යය. ලෝකයේ අද්භූතය තේරුම් ගැනීමට හා ප්‍රකාශනය කිරීමට මිනිස් මනස ගත් මේ ප්‍රථම ප්‍රයත්නයන්හි වසන්ත සමයේ පවනෙහිත් ප්‍රභාත සමයේ කුසුමයෙහිත් ආත්තාක් බඳු නවතාවක් ද චාන්කමක් ද අවිවරණීය රමණීයත්වයක් ද අපට හමුවේ.''**(රාධා කෘෂ්ණන්. 1970:39).**

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. Max Muller, F. (1869). *Rig Veda Samhita*. London.
2. Shyam Ghosh. (2002). *Rig Veda for Layman*, New Delhi: Munishiram Manoharlal Publication.
3. Suryanarain Rao. (1949). *Sri Jaimini Sutras*, Bangalore: Raman Publication.
4. රාධා කෘෂ්ණන්. (1970). *ඉන්දීය දර්ශනය - 1 කාණ්ඩය.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
5. තිලකසිරි, ජයදේව. (1958). *වෛදික සාහිත්‍යය.* කොළඹ: සී.ස. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.
6. පැට්‍රික්, නාරාවිල. (1997). *ඍග්වේද ගීතාවලී.* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.
7. බෂාම්. ඒ.එල්, (1995). *අසිරිමත් ඉන්දියාව.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
8. වින්ටර්නීට්ස්, එම්. (1967). *ඉන්දීය සාහිත්‍ය ඉතිහාසය, 1-කාණ්ඩය.* අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
9. සේනානායක, ජී. එස්. බී. (1960). *සංස්කෘත සාහිත්‍යය,* කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
10. හෙට්ටිආරච්චි. ඩී. ඊ, (1946). *දඹදිව පැරණි සාහිත්‍යය.* කොළඹ: නව ලිපිපොත් සමාජය.

**සඟරා**

11. සුගුණධම්ම නාවින්නේ, චන්දිම වත්තෙවැවේ, සරණධම්ම ජුලම්පිටියේ, (සංස්කාරක) වැලමිටියාවේ කුසලධම්ම. (2002). *ප්‍රශස්ති,* කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.